29935

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැය තුනයි

අතිරේක කියවීම් කාලය විනාඩි 10යි.

- I කොටසේ ප්‍රශ්නය ද II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
  සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය .....

I කොටස

1. (i) (අ) ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගි නොවී තම ස්වාධීන මතය ඉදිරිපත් කළ යතිවරයා කවරෙක් ද?

.....

(ආ) ප්‍රථම ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා කවරෙක් ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) ථෙරවාදීන් විසින් භාරතයේ පැවැත්වූ සංගායනා ගණන කීය ද?

.....

(ආ) බුද්ධානු බුද්ධක ප්‍රශ්නය පැන නැගුණේ කවර සංගායනාවේ දී ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) ආහාර පිළිබඳ ගැටලුව විනයට ඇතුළත් කොට නැවත ධර්ම සංගීතිය පැවැත්වීමට එකඟ වූ යතිවරයා කවරෙක් ද?

.....

(ආ) මේ බව සඳහන් වන වාර්තා අයත් වන්නේ කවර නිකාය දෙකට ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) ථෙරවාදයට පටහැනිව මහාදේව තෙරුන් ඉදිරිපත් කළ සංකල්පය කුමක් ද?

.....

(ආ) මහාදේව තෙරුන් ඉදිරිපත් කළ සංකල්පයෙහි ඇතුළත් කරුණු දෙකක් දක්වන්න.

.....

.....

(ලකුණු 03 යි)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

(v) (අ) බුද්ධ ශාසනයේ ප්‍රථම නිකාය භේදය ඇති වූයේ කවර රාජ වංස සමයේ දී ද?

.....

(ආ) මෙසේ ඇති වී ගිය නිකායේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vi) (අ) වාත්සීපුත්‍ර හිමියන් ඉදිරිපත් කළ නව මතය දක්වන්න.

.....

(ආ) වාත්සීපුත්‍ර හිමියන්ගේ නව මතය ප්‍රතික්ෂේප කරමින් රචිත කෘතිය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) අශෝක රජු උපත ලැබූයේ කවර භක්තිකයෙකු ලෙස ද?

.....

(ආ) බුදු දහම වැළඳ ගැනීමට ඔහුට උපකාර කළ යතිවරු දෙදෙනා කවුරුන් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) සිවුවන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා කවරෙක් ද?

.....

(ආ) විභාෂා ශාස්ත්‍ර ශාස්ත්‍රීය ලේඛන ලෙස සැකසීමට පත් කළ කීර්තිධර බෞද්ධ ලේඛකයාගේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(ix) (අ) 'දශ භූමි' යනු කවරේ දැයි හඳුන්වන්න.

.....

(ආ) දශ භූමි අතුරින් කරුණු දෙකක් නම කරන්න.

.....

(ලකුණු 03 යි)

(x) (අ) ඉන්දියාවේ මදුරාසියට ආසන්න බරතිත්ථ විහාරයෙහි සිට ශ්‍රී ලංකාවට පැමිණි ආචාර්යවරයාගේ නම කුමක් ද?

.....

(ආ) උන්වහන්සේ අටුවා සැපයූ ග්‍රන්ථ අතුරින් දෙකක් දක්වන්න.

.....

.....

(ලකුණු 03 යි)

[තුන්වැනි පිටුව බලන්න.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි මුද්‍රණ පූර්ණ හිමිකම් ලබා ඇත / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) අශෝක අධිරාජයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) අශෝක රජතුමා ආගමික සහනශීලතා ප්‍රතිපත්තියෙහි යෙදුණු ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) ධර්ම ප්‍රචාරය සඳහා අශෝක රජතුමා ධර්ම දූතයන් යැවූ ප්‍රදේශ අතුරින් තුනක් නම් කර, එම එක් එක් ප්‍රදේශවලට යැවූ ධර්ම දූතයන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

2. (i) බෝධිසත්ත්ව සංකල්පය හඳුන්වා, එය මහායානා බුදුසමයෙහි වර්ධනයට හේතු වූ ආකාරය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) මහායානයෙහි ඇතුළත් ධ්‍යානී බෝසත්වරුන් පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) ශ්‍රී ලාංකේය නරපතියන් දෙදෙනෙකු තෝරාගෙන ඔවුන්ගේ රාජ්‍යසමයන්හි මහායානය බලපෑ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) භාරතයේ නාලන්දා විශ්වවිද්‍යාලයෙහි ආරම්භය සිදු වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) නාලන්දා විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය පිරිස පිළිබඳ වර්ගීකරණය කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) නාලන්දා විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට පැවති ප්‍රවේශ පරීක්ෂණයේ ස්වභාවය හා එහි තරගකාරිත්වය පිළිබඳ පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) ථේරවාද ආචාර්යවරයෙකු වූ බුද්ධදත්ත හිමියන් විසින් රචිත අටුවා හා සංග්‍රහ ග්‍රන්ථ කුන පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) සුමංගල විලාසිනී, පපංචසූදනී හා මනෝරථපූරණී යන අටුවා ග්‍රන්ථවල කතුවරයා හා ඒවාට පාදක පෙළපොත් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*
   (iii) විනය පිටකය උදෙසා අටුවා ටීකා හා සංග්‍රහ ග්‍රන්ථ ලියූ ආචාර්යවරුන් හා ඔවුන්ගේ කෘති පිළිබඳ සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලැබූ බුරුම ජාතික ජප්පට හිමියන්ගෙන් එරට බුදුදහමෙහි ව්‍යාප්තිය උදෙසා ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) ක්‍රි.ව. 1339 දී ශ්‍රී ලංකාවෙන් වැඩම කළ භික්ෂූන් වහන්සේලා නිසා තායිලන්තයේ ඇති වූ ශාසනික පුනරුදය පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) මහායාන බුදුසමය පැතිර පවත්නා රටවල් දෙකක් නම් කොට, ඒවායේ මහායානා බුදුසමය ආරම්භ වූ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) පණ්ඩුකාභය රාජ්‍ය සමයෙහි ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පය දියුණුව පැවති ආකාරය සාධක මඟින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) බුදුසමය හා රජය අතර සම්බන්ධය මුල් ලක් ඉතිහාසය පුරාම පැතිර පවතින ආකාරය නිදසුන් මඟින් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) වෛතුල්‍ය වාදය හඳුන්වා එය ශ්‍රී ලංකාවට ගෙන ඒම හා එම වාදය ක්‍රමයෙන් ප්‍රතික්ෂේප වීම පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් ලියන්න. *(ලකුණු 06 යි)*

PAST PAPERS WIKI

7. (i) බුදු පිළිම නිර්මාණය ආරම්භ වීමට පෙර ඒ වෙනුවට වන්දනා කිරීමට යොදා ගත් සංකේත පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) සිවංක පිළිම හඳුන්වා ශ්‍රී ලංකාවේ එබඳු පිළිම පිහිටි ස්ථාන පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ප්‍රතිමාඝර යනු කවරේදැයි විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2563 – බෞද්ධ ධර්මාචාර්ය විභාගය – 2018 (2019)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පෑ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය :.....

I කොටස

1. (i) (අ) පුරාණ තෙරුන් ප්‍රථම සංගීතිය ප්‍රතික්ෂේප කළේ ඇයි?

.....

(ආ) මේ කරුණ සඳහන් ව ඇත්තේ කවර ග්‍රන්ථවල ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) ථෙරවාද සම්ප්‍රදායයේ පසුබිම සකස් කිරීමටත් අභිනව නිකායන්හි ආරම්භය සඳහා නැඹුරු වීමටත් හේතු වූ ප්‍රශ්නය කුමක් ද?

.....

(ආ) මේ ප්‍රශ්නය මතු වූයේ කවර අවස්ථාවක දී ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) ථෙරා හෙවත් පැරණි පෙළේ භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් ආරම්භ වූ සංගායනාව කුමක් ද?

.....

(ආ) මේ කාරණය මගින් හෙළි වන්නේ උන්වහන්සේලා තුළ පැවති කවර අරමුණක් ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) රහත් බව හීන අධිගමයක් ලෙස දක්වා ඇත්තේ කවර සංකල්පයක් මගින් ද?

.....

(ආ) මෙහිදී බුද්ධත්වය පමණක් ශ්‍රේෂ්ඨ අධිගමය ලෙස සලකනු ලබන ඉගැන්වීම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(v) (අ) සංඝ සමාජය නිකාය පහකට බෙදී ගියේ කවර රාජ්‍ය සමයකට පූර්වයේ දී ද?

.....

(ආ) මෙහිදී මහායානයෙන් බෙදී ගිය එක් නිකායක් නම් කරන්න.

.....

(ලකුණු 03 යි)

[2 වැනි පිටුව බලන්න.

Past Papers Wiki

(vi) (අ) වාත්සීපුත්‍ර හිමියන්ගේ අනුගාමිකයන් බෙදී ගිය නිකාය දෙකක් නම් කරන්න.

(I) .....

(II) .....

(ආ) මේ නිකාය අතුරෙන් වාත්සීපුත්‍ර හිමියන්ගේ මතවාද විමර්ශනය කරමින් ග්‍රන්ථයක් සම්පාදනය කළ නිකාය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) මහාවස්තුව නමැති ග්‍රන්ථය කවර නිකායකට අයත් කෘතියක් ද?

.....

(ආ) මේ නිකායේ මූලික ඉගැන්වීම දක්වන්න.

.....

(ලකුණු 03 යි)

(viii) (අ) ධර්මයාත්‍රා ක්‍රියාත්මක කළ භාරතීය නරපතියා කවරෙක් ද?

.....

(ආ) ධර්මයාත්‍රා යටතේ මේ රජතුමා සමෘද්ධියට පත් කළ අංග දෙක කවරේ ද?

.....

.....

(ලකුණු 03 යි)

(ix) (අ) බෝධිචර්යාවතාරයේ කතුවරයා කවරෙක් ද?

.....

(ආ) මේ කෘතියෙන් ඉගැන්වෙන මූලික කරුණ කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) අත්ථසාලිනී අට්ඨවාව ලියන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ආ) මේ කෘතියට වස්තු විෂය වූ පාලි නිකාය ග්‍රන්ථය හා එය අයත් වන පිටකය දක්වන්න.

.....

(ලකුණු 03 යි)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

46582

2563 – බෞද්ධ ධර්මාචාර්ය විභාගය – 2018 (2019)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) අශෝක රජතුමාගේ ධර්මවිජය සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*
(ii) එතුමාගේ සෙල්ලිපි ඇසුරෙන් මේ සංකල්පය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මේ සංකල්පය යටතේ භාරතය තුළ ධර්මප්‍රචාරය සඳහා යෙදූ ක්‍රමෝපාය විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) ධර්ම සංගායනාවක් පැවැත්වීම සඳහා කණිෂ්ක රජතුමා යොමු වූ හේතු මොනවා ද? *(ලකුණු 04 යි)*
(ii) මේ සංගායනාව පැවැත්වූ ස්ථානය හා ඊට සහභාගි වූ භික්ෂු පිරිස පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මේ සංගායනාව මගින් සිදු වූ ප්‍රතිඵල සමාලෝචනය කරන්න. *(ලකුණු 08 යි)*

4. (i) මහායාන හා හීනයාන ද්විභේදය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*
(ii) ථෙරවාදයෙන් මහායානය බෙදී ගිය ආකාරය ඓතිහාසික සාධක මගින් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මහායාන බුදුසමයේ ඉගැන්වීම්වල පවත්නා ආගමික හා දාර්ශනික අංශ දෙක නිදසුන් මගින් විභාග කරන්න. *(ලකුණු 08 යි)*

5. (i) භාරතයේ බෞද්ධ විශ්වවිද්‍යාල දෙකක් තෝරාගෙන ඒවා පිහිටි ස්ථාන, ආරම්භක රජතුමා හා ප්‍රධාන ආචාර්යවරයා යන කරුණු ඇතුළත් වන සේ කෙටි හැඳින්වීමක් කරන්න. *(ලකුණු 04 යි)*
(ii) මෙම විශ්වවිද්‍යාල දෙකෙන් එකක අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන් තෝරා ගත් ආකාරය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) ඉහත (ii) සඳහා ඔබ තෝරා ගත් විශ්වවිද්‍යාලයේ ඉගැන්වූ විෂය ක්ෂේත්‍රය විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

6. (i) මහායානය පැතිර පවත්නා රටවල් දෙකක් තෝරාගෙන ඒවායේ බුදුසමය හඳුන්වා දුන් ආකාරය කෙටියෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*
(ii) මියන්මාරයේ (බුරුමයේ) හෝ තායිලන්තයේ හෝ ථෙරවාදී බුදුසමයේ ආරම්භය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(iii) පහත යෙදුම් අතුරෙන් හතරකට කෙටි විවරණ සපයන්න.
(අ) කල්‍යාණි ශිලා ලිපි (ආ) උපාලි මහ තෙරුන් වහන්සේ
(ඉ) කුමාරජීව (ඊ) නමෝ අමිද බුත්සු
(උ) ශ්වේදගොන් (ඌ) හියුං සියෑං
(එ) කාශ්‍යප මාතංග හිමි *(ලකුණු 08 යි)*

7. (i) ශ්‍රී ලංකාවේ බුදුදහම ආරම්භ වූ ආකාරය කෙටියෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*
(ii) මිහිඳු මාහිමියන් ශ්‍රී ලංකාවේ පැවැත්වූ ධර්ම දේශනා සඳහා තෝරාගත් පාලි සූත්‍ර සහ ධර්ම ග්‍රන්ථ හඳුන්වා උන්වහන්සේ එබඳු ධර්ම කොටස් තෝරා ගැනීමට හේතු වී යැයි සැලකෙන සාධක පරීක්ෂා කරන්න. *(ලකුණු 06 යි)*
(iii) ශ්‍රී ලංකාවේ පැවැත්වූ ධර්ම දේශනා සඳහා මිහිඳු මාහිමියන් යොදා ගත් භාෂා මාධ්‍යය ඉන්දු ආර්ය ගණයට අයත් සිංහල ප්‍රාකෘතය ද නැති නම් වෙනත් භාෂා ව්‍යවහාරයක් දැයි නිදර්ශන සහිතව විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

8. (i) ගන්ධාර හෝ මථුරා හෝ බුදුපිළිම සම්ප්‍රදාය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*
(ii) ප්‍රතිමාඝර යනු කවරේදැයි හඳුන්වා ඒවා පිහිටි ස්ථාන දෙකක් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) බුදුපිළිම නෙළීමේ දී යොදා ගත් විවිධ මුද්‍රා හඳුන්වා, මේවා අතුරෙන් වඩාත් ජනප්‍රිය මුද්‍රා කවරේ දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, **II** වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය :.....

I කොටස

1. (i) (අ) ථෙරවාද සම්ප්‍රදාය අනුව භාරතයේ පැවැත්වූ සංගායනා ගණන කීය ද?

.....

(ආ) මෙයින් දෙවන සංගායනාව පවත්වන ලද්දේ කවුරුන්ගේ මතවාද බණ්ඩනය කිරීම සඳහා ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) ප්‍රථම සංගීතියේ දී සාකච්ඡාවට භාජනය වූ ඉතා වැදගත් ගැටලුව කුමක් ද?

.....

(ආ) මේ නිසා විනය සංශෝධන අපේක්ෂා කළ පිරිස් නැඟුරු වී සිටියේ කවර අරමුණක් සඳහා ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) 'මහාසංගීති' නමින් නව සංගායනාවක් පැවැත්වූයේ කවර කරුණක් මුල් කොට ගෙන ද?

.....

(ආ) මේ කරුණ ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) සම්මිතීය නිකායයේ ඉතිහාසය ලියන ලද්දේ කවරෙකු විසින් ද?

.....

(ආ) මේ නිකායේ වැඩි අවධානයක් යොමු වූයේ කවර සංකල්පයක් සඳහා ද?

.....

(ලකුණු 03 යි)

(v) (අ) ධර්මාශෝක රාජ්‍ය සමයට පෙර ථෙරවාද සම්ප්‍රදායයෙන් බෙදී ගිය නිකාය කුමක් ද?

.....

(ආ) මේ කාලය තුළ මහාසාංඝිකයන්ගෙන් බෙදී ගිය නිකාය දෙක කවරේ ද?

.....

.....

(ලකුණු 03 යි)

(vi) (අ) පංචස්කන්ධය හුදෙක් ගිනි අඟුරු ගොඩක් ලෙස උගන්වන ලද්දේ කවර නිකායයක් මගින් ද?

.....

(ආ) ලොව පවත්නා සියලු දේ හුදු නාමමාත්‍ර හා සංකල්ප පමණක් බව ඉගැන්වූවෝ කවරහු ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) 'මාඝාත' නීතිය පැනවූ භාරතීය රජකුමා කවරෙක් ද?

.....

(ආ) 'මාඝාත' යන්නෙහි අර්ථය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) අශෝක අධිරාජයාගේ අනුශාසනා භාරතීය ජනතාව අතර ප්‍රචාරය කිරීමට යෙදූ උපාය මාර්ගය කුමක් ද?

.....

(ආ) එම උපාය මාර්ගය අනුව ස්වකීය අනුශාසනා ප්‍රදර්ශනය කිරීමට රජකුමා යෙදූ ක්‍රමවිධි කවරේ ද?

.....

.....

.....

(ලකුණු 03 යි)

(ix) (අ) භදන්ත අශ්වඝෝෂ හිමියන් ජීවත් වූයේ කවර රාජ්‍ය සමයක දී ද?

.....

(ආ) භදන්ත අශ්වඝෝෂ හිමියන් සැලකෙන්නේ කවර බෞද්ධ නිකායකට අයත් වූවකු ලෙස ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) සමන්තපාසාදිකා විනය අටුවාව ලිවීමට ආරාධනා කළේ කවුරුන් විසින් ද?

.....

(ආ) මේ කෘතියේ කතුවරයාගේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018) **S 4**

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) බුදු දහමේ ඉගැන්වෙන ඇතැම් කරුණු අශෝක අධිරාජයා විසින් සිය පාලන ප්‍රතිපත්ති සඳහා උපයෝගි කරගත් අයුරු එතුමාගේ සෙල්ලිපි ඇසුරෙන් සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවට බුදුදහම ලැබුණේ මෙරට පාලකයන් හා භාරතයේ අශෝක අධිරාජයා අතර පැවති සංස්කෘතික සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙන් බව සනාථ කෙරෙන සාධක ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශ්‍රී ලංකාවේ බුදුදහම පිහිටුවීම හා ආශ්‍රිතව පවත්නා ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) මහායාන බුදුසමයෙහි ඇතුළත් බෝධිසත්ත්ව සංකල්පය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) 'බෝධි චිත්තය' යනු කුමක් දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහායාන බුදුසමයෙහි දැක්වෙන අමිතාභ බුද්ධ වන්දනාව පිළිබඳ ව විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ නාලන්දා විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැදින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) නාලන්දා විශ්වවිද්‍යාලයේ ප්‍රවේශ පරීක්ෂණයේ ස්වරූපය කෙබඳු වී දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නාලන්දා විශ්වවිද්‍යාලයේ ඉගැන්වූ විෂයධාරා පහ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) 'හෙළටුවා' යනු කවරේ දැයි හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) බුද්ධදත්ත හිමියන් විසින් ලියන ලද අටුවා හා අනෙකුත් ග්‍රන්ථ පිළිබඳ සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පෙළ පොත්වලට පසුව රචනා කළ වැදගත් පාලි ගද්‍ය ග්‍රන්ථ දෙකක් ගැන විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය පිළිබඳ හැදින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ජපානයේ පැතිර ගිය නිචිරෙන් නිකාය ගැන විස්තරයක් සපයන්න. *(ලකුණු 06 යි)*

(iii) සෙන් බුදුසමයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

7. (i) ලක්වැසියන් අතර පැතිර ගිය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය පොදුජන විශ්වාසවලට අනුකූලව ක්‍රමයෙන් හැඩගැසුණු ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවේ අනුරාධපුරයෙන් ආරම්භ වූ බුදුසමය රෝහණ ජනපදය තෙක් පැතිර යාමට බල පෑ හේතු සාධක විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) දුටුගැමුණු රජුගේ දේශපාලන කාර්යයේ සඵලතාව සඳහා අදාළ පසුබිම කාවන්තිස්ස රජතුමා විසින් සකස් කළ බවට දැක්විය හැකි හේතු සාධක කවරේ දැයි පිරික්සන්න. *(ලකුණු 06 යි)*

8. (i) බෞද්ධ ස්තූප නිර්මාණය ආරම්භයේ දී හා පරිණාමයේ දී දක්නට ලැබුණු විශේෂතා මොනවා දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) වටදා ගෙය හඳුන්වා, ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වටදා ගෙවල් පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බෞද්ධ ස්තූප වර්ග නම් කොට, ඒවායින් හතරක ආකෘතික ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ සියලු ප්‍රශ්නවලට ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍ර සමග අමුණා ශාලාධිපතිට භාරදෙන්න.

විභාග අංකය :.....

I කොටස

1. (i) (අ) භාරතයේ සිවුවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ කවර බෞද්ධ සම්ප්‍රදායයක් විසින් ද?

.....

(ආ) මේ සංගායනාවේ අනුග්‍රාහකත්වය දැරූ රජතුමා කවරෙක් ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) බුදුරදුන්ගේ අනුමැතිය ලැබුණු ආහාර පිළිබඳ කරුණු ප්‍රථම සංගීතියේ දී සම්මත විනයෙන් ඉවත් වී ඇතැයි ප්‍රකාශ කළේ කවරෙක් ද?

.....

(ආ) මේ කාරණය ගැන සඳහන් කරන ග්‍රන්ථ අයත් වන එක් නිකායක් නම් කරන්න.

.....

(ලකුණු 02 යි)

(iii) (අ) අර්හත් සංකල්පය යටතේ ථෙරවාද භික්ෂූන්ට පටහැනිව කරුණු ඉදිරිපත් කළ යතිවරයාණෝ කවරහු ද?

.....

(ආ) මේ යතිවරයාගේ අදහස් ප්‍රතික්ෂේප කිරීමට රචිත ග්‍රන්ථය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) නන්ද රාජවංශය යටතේ භාරතයේ පිහිටුවන ලද නිකාය කුමක් ද?

.....

(ආ) ගෝකුලික නිකාය ආරම්භ වූ බව සැලකෙන්නේ කවර රජෙකුගේ කාලයේ දී ද?

.....

(ලකුණු 03 යි)

[2 වැනි පිටුව බලන්න.

Past Papers Wiki

(v) (අ) අශෝක රජු සමග කුලුපගව සිටියේයැයි සැලකෙන සර්වාස්තිවාදී නිකායේ යතිවරයාගේ නම කුමක් ද?

.....

(ආ) සර්වාස්තිවාදීන්ගේ බලකොටු ලෙස සැලකෙන්නේ භාරතයේ කවර ප්‍රදේශ ද?

.....

(ලකුණු 03 යි)

(vi) (අ) ලෝකෝතරවාදයේ මූලික ඉගැන්වීම කුමක් ද?

.....

(ආ) මේ නිකායිකයන්ගේ අදහස් ඇතුළත් ග්‍රන්ථ **දෙක** කවරේ ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) ධර්මාශෝක රාජ්‍ය සමයේ දී සෝණ හා උත්තර යන තෙරවරුන් ධර්මප්‍රචාරය සඳහා වැඩම කළ රට නම් කරන්න.

.....

(ආ) මේ රටේ වර්තමාන නාමය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) ධර්මාශෝක නරපතියාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය කෙබඳු වූවක් දැයි කෙටියෙන් පහදන්න.

.....

(ආ) එතුමා ක්‍රියාත්මක කළ 'ආගමික සහනසීලත්වය' මගින් නිරූපණය වන්නේ කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(ix) (අ) කණිෂ්ක රජතුමා අයත්වන වංශය කුමක් ද?

.....

(ආ) කණිෂ්ක සංගීතියේ ප්‍රමුඛත්වය දැරූ යතිවරු දෙදෙනා කවරහු ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) 'බුද්ධවංස' නම් කෘතියට ලියූ අටුවා ග්‍රන්ථය කුමක් ද?

.....

(ආ) මේ ග්‍රන්ථයේ කතුවරයා කවරෙක් ද?

.....

(ලකුණු 03 යි)

PAST PAPERS WIKI

* *

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) බුදුදහමේ චිරස්තිය සඳහා අශෝක රජතුමාගෙන් සැලසුණු සේවය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) කාලිංග සංග්‍රාමයෙන් ලැබූ විජයග්‍රහණය අශෝක රජතුමා බුදුදහම වෙත ඇදීයාමට තුඩුදුන් ප්‍රධාන හේතුව ලෙස සැලකීමේ යෝග්‍යතාව විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) චක්‍රවර්ති සංකල්පය අනුව රාජ්‍ය පාලනය කළ ප්‍රථමයා ධර්මාශෝක රජු බව තහවුරු කෙරෙන සාධක ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) මහායාන බුදුසමයේ ආරම්භය හඳුන්වා දෙමින් හීනයාන හා මහායාන සම්ප්‍රදායයන්හි පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහායාන සම්ප්‍රදායයෙහි දැක්වෙන ප්‍රධාන මත භතර නම් කොට එයින් එකක් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහායාන බුදුදහමේ ඇතුළත් 'දශභූමි' නම් වශයෙන් දක්වා එයින් පහක් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ වලභි විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැදින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මේ විශ්වවිද්‍යාලයේ ඉගැන්වූ අධ්‍යාපන විෂයමාලාව හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) හියුංසියෑං, ඉත්සිං වැනි සංචාරකයන් මේ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දියුණුව ගැන පළකරන අදහස් සමාලෝචනය කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ථෙරවාද බුද්ධ ධර්මයේ චිරස්ථිතිය උදෙසා ක්‍රියා කළ භාරතීය පඬිවරුන් දෙදෙනෙකු ගැන හැදින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) සූත්‍ර පිටකයට අයත් නිකාය ග්‍රන්ථවලට ලියූ අටුවා පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න. *(ලකුණු 06 යි)*

(iii) බුද්දකනිකාය හඳුන්වා ඊට අයත් බුද්දකපාඨ, ධම්මපද හා සුත්තනිපාත යන ග්‍රන්ථ උදෙසා රචිත අටුවා ගැන කෙටි විවරණ සපයන්න. *(ලකුණු 06 යි)*

6. (i) මියන්මාරයට (බුරුමයට) බුදුසමය හඳුන්වා දීම පිළිබඳ පවත්නා කතා පුවත් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) පළමුවන විජයබාහු රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාව හා මියන්මාරය (බුරුමය) අතර පැවති බෞද්ධාගාමික සම්බන්ධතා පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මියන්මාරයේ (බුරුමයේ) කල්‍යාණි ශිලා ලිපියෙන් හෙළිවන ඓතිහාසික වැදගත්කම විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දීමත් සමග එවකට පැවති දේශීය ඇදහිලි හා විශ්වාස බුදුදහමට අනුවර්තනය වූ ආකාරය කෙටියෙන් දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ ජෛනාගම පැවති බවට දැක්විය හැකි සාධක කවරේදැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ජෛන ආගමට අමතරව මේ වකවානුවේ ශ්‍රී ලංකාවේ පැවති වෙනත් ආගමික ඇදහිලි විශ්වාස කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) බුද්ධ ප්‍රතිමා වන්දනාවේ ආගමික වැදගත්කම හඳුන්වා බුදුපිළිම නිර්මාණයේ ආරම්භය පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) විවිධ ඉරියවු අනුව බුදුපිළිම වර්ග කොට ඇති ආකාරය හඳුන්වා එම පිළිම පිහිටා ඇති ශ්‍රී ලංකාවේ ඓතිහාසික ආගමික ස්ථාන නිදසුන් මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බුදුපිළිම නෙළීමේ දී උපයෝගි කොට ගෙන ඇති ආසන වර්ග කවරේදැයි නිදසුන් මගින් විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2560 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2015 (2016)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ සියලු ප්‍රශ්නවලට ද, **II** වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා ශාලාධිපතිට භාර දෙන්න.

විභාග අංකය :.....

I කොටස

1. (i) (අ) ධර්ම සංගායනාවල මූලික අරමුණ කුමක් ද?

.....

(ආ) එහෙත් සංගායනාවල ඓතිහාසික ප්‍රතිඵලය කුමක් වී ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) භික්ෂූන් උදෙසා බුදුරදුන්ගේ අවසරය ලැබුණත් ප්‍රථම සංගීතියේ දී විනයෙන් බැහැර වූ බව සැලකෙන කරුණු අටෙහි මූලික තේමාව වූයේ කුමක් ද?

.....

(ආ) මේ කරුණු අට ප්‍රථම සංගීතියේ දී විනයෙන් බැහැර කිරීම ගැන විරෝධය පළ කළ යතිවරයාගේ නම ලියන්න.

.....

(ලකුණු 02 යි)

(iii) (අ) "මහා සංගීතිය" නමින් සංගායනාවක් පවත්වන ලද්දේ කවර අභිමතාර්ථයක් සපුරා ගැනීම සඳහා ද?

.....

(ආ) මේ "මහා සංගීතියේ" ප්‍රතිඵලය කුමක් වී ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) "ඒකබ්බොහාරික" නමින් හැඳින්වුණු නව ශාඛාව කවර නිකායකින් බිහි වූයේ ද?

.....

(ආ) මේ නව ශාඛාවේ මූලික ඉගැන්වීම වූයේ කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(v) (අ) ථෙරවාද නිකායේ භේදයක් ඇති වීමට කවර කරුණක් හේතු වී ද?

.....

[2 වැනි පිටුව බලන්න.

(ආ) මේ භේදය ඇති කිරීමට මුල් වූයේ කවරෙක් ද?

.....

(ලකුණු 03 යි)

(vi) (අ) බුද්ධ පූජා හා ස්තූප පූජා කෙරෙහි විශේෂයෙන් ඇදී ගියේ කවර නිකායක් ද?

.....

(ආ) මේ නිකාය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) ධර්මාශෝක රාජ්‍ය සමයේ දී මහා ධම්මරක්ඛිත තෙරණුවන් ධර්මප්‍රචාරක කටයුතු සඳහා වැඩම කළ ප්‍රදේශය නම් කරන්න.

.....

(ආ) මේ ප්‍රදේශය වර්තමානයේ හැඳින්වෙන්නේ කවර නමකින් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) කණිෂ්ක රාජ්‍ය සමයේ පැවති සංගායනාවේ මූලිකත්වය දැරූ තෙරවරු දෙදෙනා කවරහු ද?

.....

(ආ) මේ සංගායනාවේ දී ත්‍රිපිටක ධර්මය පිළිබඳ මතභේද නිරාකරණය සඳහා ලියූ ග්‍රන්ථ හැඳින් වූ පොදු නාමය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(ix) (අ) කථාවත්ථුප්පකරණය රචනා කළේ කවුරුන් විසින් ද?

.....

(ආ) මේ කෘතිය මගින් ඛණ්ඩනය කරන ලද මතවාදය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) සම්පූර්ණ විනය පිටකයම ආවරණය කරමින් බුද්ධඝෝෂ හිමියන් විසින් සකස් කරන ලද කෘතිය නම් කරන්න.

.....

(ආ) මේ ග්‍රන්ථය සකස් කිරීමට ආරාධනා කළ තෙරණුවෝ කවුරු ද?

.....

(ලකුණු 03 යි)

* *

2560 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2015 (2016)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) සර්වාස්තිවාද නිකායේ උන්නතිය උදෙසා කණිෂ්ක රජුගෙන් සිදු වූ සේවය පහදන්න. *(ලකුණු 06 යි)*

(ii) කණිෂ්ක පාලන සමයේ දී කළ සංගායනාවේ දී කීර්තිධර ලේඛකයකු වූ අශ්වඝෝෂ හිමියන්ගෙන් සැලසුණු සේවය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "බෞද්ධ ඉතිහාසය හා සාහිත්‍යය අතින් සලකන කළ කණිෂ්ක සංගායනාව අතිශය වැදගත් තැනක් උසුලයි." මේ අදහස විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) මහායාන බුදුසමයෙහි දාර්ශනික හා ආගමික අංශ යටතේ අවධානයට පාත්‍ර වන ඉගැන්වීම් ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහායාන බුදුදහමෙහි ඉගැන්වෙන "බෝධිචිත්තය" ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) අමිතාභ බුදුන් ආශ්‍රිතව පවත්නා ඇදහිලි හා විශ්වාස ගැන සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ වික්‍රමශිලා විශ්ව විද්‍යාලයේ පැවති අධ්‍යාපන තත්ත්වය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මෙම විශ්ව විද්‍යාලයේ ප්‍රවේශ පරීක්ෂණය භාර වූ ද්වාර පණ්ඩිතවරුන් හඳුන්වා, ඔවුන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) වික්‍රමශිලා විශ්ව විද්‍යාලයෙහි අධිපතිභාවය ඉසිළූ ශ්‍රී ඥාන හෙවත් අතීශ හිමියන් ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) "අට්ඨකථා" යන්නෙහි අරුත් පැහැදිලි කරමින් දීඝ, මජ්ඣිම, සංයුක්ත හා අංගුත්තර අටුවා හැඳින්වෙන සංඥා නාම පිළිවෙළින් දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථ සඳහා ලියූ අටුවා හැඳින්වෙන සංඥා නාම ලියා දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) හෙළටුවා යනු කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) 18 වන සියවසේ දී තායිලන්ත (සියම්) දේශයේ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකාවේ ස්‍යාමෝපාලි මහා නිකායේ ආරම්භය හා උපසම්පදා විනයකර්මය සිදු කිරීම පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) තායිලන්තයට බුදුසමය හඳුන්වා දෙනු ලැබුයේ ධර්මාශෝක රාජ්‍ය සමයේ භාරතයේ සිට වැඩම කළ ධර්ම දූතයන් මගින් බව තහවුරු කෙරෙන සාධක කවරේදැයි හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) ථෙරවාද බුදු දහම ව්‍යාප්තව පවත්නා අග්නිදිග ආසියාතික රටවල් පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) ප්‍රාග් මහින්ද යුගයේ දී මළගියවුන් පිළිබඳ විශ්වාසය සමාජයේ දැඩිව පැවති බව තහවුරු කෙරෙන සාධක විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(ii) සත්ත්ව ඝාතනය වළක්වා සතුන් කෙරෙහි කරුණාව දැක්වීමට මහජනතාව යොමු කළ ශ්‍රී ලාංකේය රජවරු පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බුද්ධ ශාසනයේ දියුණුව උදෙසා වළගම්බා රජතුමාගෙන් ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) බෞද්ධ ස්තූප නිර්මාණයේ ආරම්භය හඳුන්වා, ප්‍රාග් මහින්ද යුගයේ දී ශ්‍රී ලංකාවේ නිර්මාණය කරන ලදැයි සැලකෙන ස්තූප ගැන විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බෞද්ධ ස්තූපයක ඇතුළත් විය යුතු අංගෝපාංග කවරේ දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) විවිධ ස්තූප වර්ග හඳුන්වා, ඒවායේ හැඩයන් නිදසුන් මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

* * *

PAST PAPERS WIKI

බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

කාලය පැ. 3 යි.

(I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.)

I කොටස

01. i. අ) ප්‍රථම සංගීතියේ දී සාකච්ඡාවට භාජනය වූ ඉතා වැදගත් ගැටලුව කුමක් ද?

.....

ආ) විනය ශික්ෂාවන්හි දැඩිව එල්බ ගත්තේ කවර සම්ප්‍රදායක්ද?

.....

ii. අ) පුරාණ තෙරුන් ප්‍රථම සංගීතිය ප්‍රතික්ෂේප කළ බව සඳහන් වන්නේ කවර නිකායික ග්‍රන්ථවල ද?

.....

ආ) පුරාණ තෙරුන් ප්‍රථම සංගීතිය ප්‍රතික්ෂේප කළේ ඇයි?

.....

iii. අ) වජ්ජි භික්ෂූන්ට එරෙහිව ක්‍රියාත්මක වූවෝ කවරහු ද?

.....

ආ) ඔවුන් එසේ වජ්ජි භික්ෂූන්ට එරෙහිව ක්‍රියාත්මක වීමට බලපෑ හේතුව කුමක් ද?

iv. අ) පංච වස්තුව ඉදිරිපත් කළේ කවරෙක් ද?

.....

ආ) පංච වස්තුව නිසා බුද්ධ ශාසනයේ මතු වූ අර්බුධකාරී තත්ත්වය කුමක් ද?

.....

v. අ) සම්මිතීය නිකායයේ ඉතිහාසය ලියූවේ කවරෙක් ද?

.....

ආ) ඔහු ඉදිරිපත් කළ ඓතිහාසික සිදුවීම කුමක් ද?

.....

vi. අ) "පුද්ගල සංකල්පය" යනු කුමක්ද?

.....

ආ) අශෝක රජුගේ රණශූරත්වයත්, ස්වකීය විජයග්‍රහණයෙන් පසු, පසුතැවෙන ආකාරයත් හෙළිකරන සෙල්ලිපිය නම් කරන්න.

.....

vii. අ) මුළු මහත් ත්‍රිපිටකයම අළලා බුද්ධඝෝෂ හිමියන් ලියූ කෘතිය කුමක් ද?

.....

ආ) මේ කෘතිය ලිවීමට ආරාධනා කළේ කවරෙක් ද?

.....

Scanned by CamScanner

viii. අ) නාලන්දා විශ්ව විද්‍යාලය පිහිටියේ භාරතයේ කවර ප්‍රදේශයක ද?

.....

ආ) මේ ආයතනයේ ප්‍රමුඛස්ථානය හිමි වූයේ කවර බෞද්ධ සම්ප්‍රදායක් සඳහා ද?

.....

ix. අ) අශ්වඝෝෂ හිමියන් විසින් සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලද දෘශ්‍ය කාව්‍යයේ නම කුමක් ද?

.....

ආ) මේ හිමියන් විසූයේ කවර රාජ්‍ය සමයේ දීද?

.....

x අ) මහින්දාගමනයට පෙර මෙරට තහනම්ව ඇතැයි සිතිය හැකි ස්තූප දෙකක් නම් කරන්න.

.....

ආ) මහින්දාගමනයෙන් පසු මෙරට ගොඩනංවන ලද ප්‍රථම ස්තූපය කුමක් ද?

.....

Scanned by CamScanner

2559 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) කණිෂ්ක රජු බුදුදහම වැළඳ ගත් ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(ii) කණිෂ්ක රජුගේ ආගමික සේවාව ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*
(iii) විභාෂා ග්‍රන්ථ යනු කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

3. (i) ථෙරවාදීන් හා මහායානිකයන් සංසාර විමුක්තිය උදෙසා අනුගමනය කළ ඒකායන මාර්ග පිළිබඳ සංසන්දනාත්මක විවරණයක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) ථෙරවාද හා මහායාන දෙකෙහි බුද්ධ සංකල්පය ආශ්‍රිතව පවත්නා මතවාද විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*
(iii) "පොදුජන සිතුම් පැතුම්වලට වඩාත් නැඹුරු වූයේ ථෙරවාදයට වඩා මහායානයයි" විමසන්න. *(ලකුණු 06 යි)*

4. (i) වලහී විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) හියුං සියෑං හා ඉට්සිං යන සංචාරකයින් මේ විශ්වවිද්‍යාලය ගැන පළ කරන අදහස් සමාලෝචනය කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මේ විශ්වවිද්‍යාලයේ ඉගැන් වූ අධ්‍යාපන විෂයමාලාව ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ශ්‍රී ලංකාව හා මියන්මාරය (බුරුමය) අතර පැවති පැරණි ආගමික සබඳතා ගැන විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) මියන්මාරයට බුදුදහම හඳුන්වා දීම පිළිබඳ පවත්නා මතවාද පිරික්සන්න. *(ලකුණු 06 යි)*
(iii) "කල්‍යාණි ශිලාලිපිය" මගින් හෙළි කරන තොරතුරු මියන්මාරයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද බෞද්ධයන්ට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) ප්‍රාග් මහින්ද යුගයේ දී මෙරට වාසය කළ විවිධ ජනවර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) ඉහත සඳහන් කාලය තුළ ශ්‍රී ලංකා සමාජයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මහින්දාගමනයත් සමග යථෝක්ත ආගමික ඇදහිලි හා විශ්වාස නව මුහුණුවරක් ගනිමින් විකාශනය වූ ආකාරය විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) බුදුසමයේ දියුණුව හා චිරස්ථිතිය උදෙසා දුටුගැමුණු රජතුමාගෙන් සැලසුණු සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) "මහජන සුබසාධනය හා සෞඛ්‍යය සඳහා පැරණි ශ්‍රී ලාංකික පාලකයන්ගෙන් ලැබුණේ නොමද අනුග්‍රහයකි." පිරික්සන්න. *(ලකුණු 06 යි)*
(iii) මහසෙන් රාජ්‍ය සමයෙහි ථෙරවාදයේ චිරස්ථිතියට හානිකර වූ මහායාන බලවේග ශ්‍රී ලංකාවේ පැතිර ගිය ආකාරය විභාග කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) බුදුපිළිම නිර්මාණයේ ආරම්භය හා විකාශනය ආශ්‍රිතව පවත්නා මතවාද පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) මථුරා හා ආන්ධ්‍ර බුදුපිළිම නිර්මාණයේ දක්නට ලැබෙන විශේෂතා පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(iii) බුදුපිළිමවල මුද්‍රා භාවිත කිරීමේ අරමුණු හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාවේ බහුලව යොදා ඇති මුද්‍රා හා ඊට අදාළ පිළිම පිහිටි ස්ථාන කවරේ දැයි දක්වන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner

(I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.)

I කොටස

01. i. අ) පුරාණ තෙරණුවන් ධර්ම ගුප්තික හා මහිසාංසික යන දෙනිකායේ ම පිළිගැනීමට පාත්‍ර වුයේ කවරකු විශයෙන්ද?

.....

.....

ආ) ප්‍රථම ධර්ම සංගීතයෙන් පසු පුරාණ තෙරණුවන් මහාකාශ්‍යප හිමියන් සමග ඇති කර ගත් එකඟතාව කුමක්ද?

.....

.....

ii. අ) අලුත් විනය නීති නොපැවැත්වීමත් බුදුරදුන් පැනවූ ශික්ෂා පද සියල්ල නොවෙනස්ව තබා ගැනීමත් පාදක කොට ගෙන ප්‍රථම ධර්ම සංගායනාවේදී පිළිගත් සංරක්ෂණවාදී සම්මුතිය නිසා වෙන ධර්ම සංගායනාවේදී භික්ෂූන් අතර මතු වූ ගැටලුව කුමක් ද?

.....

ආ) දෙවන ධර්ම සංගායනාවේ දී සංරක්ෂණවාදී සම්මුතියට පටහැනිව සංශෝධනවාදී පිළිවෙත අනුගමනය කළ භික්ෂූන් හැඳින්වූයේ කවර නමකින් ද?

.....

iii. අ) රහත් බව හීන අධිගමයක් ලෙස දැක්වීමෙන් තහවුරු කිරීමට ඉදිරපත් කල පාර්ශවයේ නායකයා වුයේ කවරෙක් ද?

.....

ආ) රහත් බව හීන අධිගමයක් ලෙස දැක්වීමෙන් තහවුරු කිරීමට උත්සාහ ගෙන ඇත්තේ කෙබඳු මහායාන සංකල්පයක් ද?

.....

iv. අ) වාත්සීපුත්‍ර හිමියන් ඉදිරපත් කළ නව මතය කුමක්ද?

.....

ආ) මේ මතයට විරුද්ධව කරුණු ඉදිරිපත් කළ තෙරවරුවගේ අදහස් හා ඒවා තහවුරු කිරීමට රචිත ග්‍රන්ථයේ නම ඉදිරිපත් කරන්න.

.....

v අ) තාරානාථ තෙරණුවන්ගේ වාර්තා අනුව තෙවන ධර්ම සංගායනාවේ දී ශාසනයෙන් නෙරපා දැමූ අය පැවිද්දන් විශයෙන් ජීවත් වූ ප්‍රදේශ මොනවා ද?

.....

.....

ආ) අශෝක රජුගේ ධර්මයාත්‍ර වන්දනා ගමනේ දී මාර්ගොපදේශකත්වය ලබා දුන්නේ කවරෙක්ද?

.....

.....

vi. අ) "පුද්ගල සංකල්පය" යනු කුමක්ද?

.....

Scanned by CamScanner

ආ) ස්ථවිවාදයෙන් බිඳී ගිය නිකාය අතර බුද්ධි පූජා හා ස්තූප පූජා ගැන ප්‍රියමානාතාවයක් දැක්වූ නිකාය කුමක්ද?

.....

vii. අ) බුද්ධඝෝෂ හිමියන් මනෝරථපූරණී නම් අටුවා ග්‍රන්ථය ලියූවේ කවර නිකාය ග්‍රන්ථයක් උදෙසා ද?

.....

ආ) මේ අටුවා ග්‍රන්ථය ලිවීමට ආරාධනා කළෝ කවරහුද?

.....

viii. අ) ජලද්දලා විශ්ව විද්‍යාලය ගොඩ නැංවූ රජතුමා හා ඔහු අයත් රජ පෙළපත නම් කරන්න.

.....

.....

ආ) මේ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පටිපාටියෙහි ප්‍රමුඛස්ථානයක් හිමි වූයේ කවර විෂයක් සඳහා ද?

.....

ix. අ) ක්‍රි.ව.11 වන සියවසේ දී ශ්‍රී ලංකාවට පැමිණි භික්ෂූන් දෙනම නම් කරන්න.

.....

ආ) මේ භික්ෂූන් දෙනම පැමිණෙද්දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය කරවූ රජතුමා කවරෙක් ද?

.....

x. අ) බුදු පිළිම නෙලීම ආශ්‍රිතව පැතිර ගිය කලා සම්ප්‍රදාය කෙතෙක් දැයි නම් කරන්න.

.....

.....

ආ) අනුරාධපුර පන්කුලියේ අශෝකාරාමයේ බුදු පිළිමයෙන් නිරූපණය වන්නේ කවර මුද්‍රාවක් ද?

Scanned by CamScanner

2558 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2013 (2014)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) පාරමිතා යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැයි දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) මහායාන පාරමිතා කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) ථෙරවාදයට අයත් පාරමිතා මහායානයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) ධර්ම සංගායනා පැවැත්වීමේ මූලික අරමුණු පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) සංඝ සමාජයේ මතභේද ඇති කිරීමෙහි ලා ධර්ම සංගායනා කොතෙක් දුර හේතුවී ඇත් දැයි පරීක්ෂා කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශාසන ඉතිහාසයේ විශේෂ ස්ථානයක් තෙවන ධර්ම සංගායනාවට හිමි වන ආකාරය තහවුරු කිරීමට අදාළ සාධක කවරේ දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ පැවති පැරණි බෞද්ධ විශ්ව විද්‍යාලවලින් එකක් ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ඔබේ හැඳින්වීමට පාත්‍ර වූ විශ්ව විද්‍යාලයේ ඉගැන්වූ විෂය ධාරාව ගැන විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) වර්තමාන උසස් අධ්‍යාපන ක්‍රමවලට වඩා මේවායේ පැවති අධ්‍යාපන ක්‍රමවල දැකිය හැකි විශේෂතා මොනවා දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ප්‍රාග් බෞද්ධ යුගයේදී ශ්‍රී ලාංකික සමාජය තුළ කිසියම් ආකාරයක සංස්කෘතික දියුණුවක් පැවති බවට ඉදිරිපත් කළ හැකි සාධක කවරේ දැයි විජයාගමනයේදී දක්නට ලැබුණු විශේෂ සිදුවීම් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහින්දාගමනයට පෙර පවා ශ්‍රී ලාංකිකයන් කෘෂිකර්මය, ලේඛන කලාව හා ගෘහනිර්මාණ ශිල්පය අතින් දියුණු තත්ත්වයක සිටි බවට ඉදිරිපත් කළ හැකි සාධක කවරේ දැයි පිරික්සන්න. *(ලකුණු 06 යි)*

(iii) "දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේදී ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වූයේ හුදෙක් ආගමික විශ්වාස සමූහයකට වඩා පුළුල් ඵලදායී සංස්කෘතික බලවේගයකි." මේ අදහස විමසීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) ශ්‍රී ලාංකිකයන් අතර ආගමික සහජීවනය ඇති කිරීමෙහිලා පණ්ඩුකාභය රජතුමාගෙන් ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම ශ්‍රී ලාංකික සමාජයෙහි බ්‍රාහ්මණයින්ට සුවිශේෂ ස්ථානයක් හිමිව පැවති ආකාරය විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "යක්ෂයින් ජනතාවට ඉතා සමීපව ක්‍රියා කළ ආකාරය ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති යක්ෂ ඇදහිල්ල මගින් අනාවරණය වේ." විමසන්න. *(ලකුණු 06 යි)*

7. (i) මෙරට ස්වෛරීභාවය ආරක්ෂා කිරීම මෙන්ම බුදුසමයේ පැවැත්ම ද උදෙසා වළගම්බා රජුගෙන් ඉටුවූ සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහින්දාගමනයත් සමග ශ්‍රී ලංකාවේ ආරම්භ වූ සාංඝික ක්‍රමය වළගම්බා රාජ්‍ය සමයේ සිට නව මුහුණුවරක් ගත් ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) අනුරාධපුර යුගයේදී ලක්දිව භික්ෂු සංස්ථාව තුළ ඇති වූ ප්‍රධාන නිකාය ගැන විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) ත්‍රිවිධ බෞද්ධ චෛත්‍යයන්හි ආරම්භය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බුදුරදුන් ජීවමාන අවදියේදීම බෞද්ධ ස්තූප නිර්මාණය පැවැති බවට ඉදිරිපත් කළ හැකි සාධක විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විවිධ ස්තූප වර්ග (ආකෘති) කවරේ දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner

බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2012 (2013)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

(කාලය :පැය 03 යි.)

සැ.යු. : I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියා කොටස් පිළිතුරු සමඟ අමුණා ශාලාධිපතිට භාරදෙන්න.

01. i) (අ). ධර්මගුප්තික හා මහාසාංඝික යන දෙනිකායන්හි ආදී පුරුෂයා ලෙස සැලකෙන්නේ.

.....

(ආ) මෙ ආදී පුරුෂයා ප්‍රථම සංගීතිය ප්‍රතික්ෂේප කළේ කවර හේතුවක් නිසද?

.....

(ලකුණු 02 යි)

ii) (අ). දෙවන ධර් සංඝායනාව පැවැත්වීමට හේතු වූ මතවාද ඉදිරිපත් කළ භික්ෂු පිරිස හැඳින්වෙන්නේ කවර නමකින්ද?

.....

.....

(ආ) මේ භික්ෂු පිරිස ඉදිරිපත් කළ මතවාදය කුමක්ද?

(ලකුණු 02 යි)

iii) (අ). මහාදේව තෙරුන්ට ශාසන ඉතිහාසයේ වැදගත් තැනක් හිමිවෙන්නේ ඇයි?

.....

(ආ). මේ තෙරුන් ඉදිරිපත් කළ නව මතය කුමක්ද?

.....

(ලකුණු 02 යි)

iv) (අ). "පුද්ගල සංකල්පය" යනු කුමක්ද?

.....

(ආ). මෙය කවරෙකුගේ සංකල්පයක්ද?

.....

(ලකුණු 03 යි)

v) (අ). සර්වාස්තිතකවාදයේ ප්‍රමුඛයෙකු ලෙස සැලකෙන භික්ෂුවගේ නම කුමක්ද?

.....

(ආ). භාරතයේ පැතිර යන ගිය ප්‍රධාන ප්‍රදේශ දෙක නම් කරන්න.

.....

(ලකුණු 03 යි)

vi) (අ). බහුස්සුතික හා පඤ්ඤත්තිවාද යන නිකායද්වය බිඳී ගියේ කවර නිකායක්ද?

.....

Scanned by CamScanner

Past Papers Wiki

(ආ) මේ නිකායද්වය ආරම්භ කළේ කවුරුන් විසින්ද?

.....

.....

(ලකුණු 03 යි)

vii) (අ) "කථාවත්ථුප්පකරණය" මඟින ඉදිරිපත් කෙරෙන මූලික ඉගැන්වීම කුමක්ද?

.....

(ආ) මේ කෘතිය සම්පාදනය කරන ලද්දේ. කවර වකවානුවකද?

.....

(ලකුණු 03 යි)

viii) (අ) භාරතයේ වලහී විශ්ව විද්‍යාලය පිහිටුවීම සඳහා අනුග්‍රහය දැක්වූ රජවරුන් හැඳින්වෙන්නේ කවර නමකින්ද?

.....

(ආ) මේ විශ්ව විද්‍යාලයේ ආරම්භ කිරීමට ප්‍රරෝගාමී වූ වියත් යතිවරුන්ගේ නම් දක්වන්න.

.....

(ලකුණු 03 යි)

ix) (අ) 11 වන සියවසේ බෞද්ධ දූත පිරිසක් ශ්‍රී ලංකාවට එවා බෞද්ධ ධර්ම ග්‍රන්ථ ගෙන්වා ගත් බුරුම (මියන්මාර) රජතුමාගේ නම කුමක්ද?

.....

(ආ) මේ රජතුමා පසු කාලයේදී ශ්‍රී ලංකාවට එවූ භික්ෂු දෙනමගේ නම් දක්වන්න.

....

(ලකුණු 03 යි)

x) (අ) "ප්‍රතිමා ඝර" යනු කුමක්ද?

.....

.....

(ආ) මේවා ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ස්ථාන දෙකක් නම් කරන්න.

.....

.....

(ලකුණු 03 යි)

PAST PAPERS WIKI

Scanned by CamScanner

2557 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2012(2013)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

(ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) "බෝධිසත්ත්ව සංකල්පය" හඳුන්වා, ථෙරවාද හා මහායාන සම්ප්‍රදායයන්හි මේ සංකල්පය පිළිබඳව ඉදිරිපත් කෙරෙන අර්ථ නිරූපණ පහදන්න. *(ලකුණු 06 යි)*

(ii) මහායාන පිළිගැනීම අනුව බෝධිසත්ත්වචරයෙකු සතුව තිබිය යුතු මහාකරුණාව හා මහාප්‍රඥාව විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "බෝධි චිත්තය" යනු කුමක්දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) මහායාන ග්‍රන්ථවල දැක්වෙන "ධ්‍යානී බෝධිසත්ත්වවරුන්" නම් වශයෙන් දක්වා ඔවුන් ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහායාන බුදුදහමෙහි 'දසභූමි' යනු කවරේ දැයි හඳුන්වා එයින් **හයක්** විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහායාන බුදුදහමෙහි ඇතුළත් 'පාරමිතා' ගැන හැඳින්වීමක් කොට එයින් **හයක්** පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) කණිෂ්ක රජතුමා බුදුදහම වැළඳගත් ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) විභාෂා ග්‍රන්ථ යනු කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහයෙන් පැවැත් වූ ධර්ම සංගායනාව පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) භාරතයේ නාලන්දා විශ්ව විද්‍යාලයෙහි ඉගැන්වූ ලෞකික අධ්‍යයන විෂය ධාරාව විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) එම විශ්ව විද්‍යාලයේ ග්‍රන්ථකරණයෙහි යෙදුණු ආචාර්යවරුන් **තිදෙනෙකු** හා ඔවුන් විසින් රචිත කෘති පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) එම විශ්ව විද්‍යාලයේ ඉගැන්වීමේදී යොදාගත් අධ්‍යාපන ක්‍රම පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) මිහිඳු මාහිමියන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ පිරිසිදු ථෙරවාද බුදුදහම බව තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි සාධක කවරේ දැයි පිරික්සන්න. *(ලකුණු 06 යි)*

(ii) දේවානම් පියතිස්ස රාජ්‍ය සමයෙහි සිදු වූ මහින්දාගමනය භාරතය හා ශ්‍රී ලංකාව අතර කෙටි කාලයක් තුළ පැවති සබඳතාවල උසස් ප්‍රතිඵලයක් ලෙස හැඳින්වීමට තුඩු දුන් හේතු සාධක පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බෞද්ධ ධර්ම ප්‍රචාරය සඳහා මිහිඳු මාහිමියන් යොදා ගත් භාෂාවන් එවකට ශ්‍රී ලංකාවේ ව්‍යවහාර වූ භාෂාවන් අතර සමීප සම්බන්ධයක් පැවති බවට දැක්විය හැකි සාධක විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) ප්‍රාග් මහින්ද යුගයේදී ශ්‍රී ලංකාවේ මළවුන් ඇදහීම පැවති බව තහවුරු කළ හැකි සාධක පිළිබඳ සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) පැරණි ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මණයන් හා ඔවුන්ගේ ඇදහිලි විශ්වාස සඳහා වැදගත් තැනක් ලැබී තිබුණු බවට දැක්විය හැකි හේතු සාධක පිරික්සන්න. *(ලකුණු 06 යි)*

(iii) මහින්දාගමනයට පෙර විවිධ ශ්‍රමණ සම්ප්‍රදායයන්ට අයත් පැවිද්දන් ශ්‍රී ලංකාවේ විසූ බව සනාථ කළ හැකි සාධක ගැන විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) ශ්‍රී ලංකාවේ ස්තූප නිර්මාණයේ ආරම්භය හඳුන්වා ඔබ කැමති එක් ස්තූපයක පවත්නා ඓතිහාසික හා ආගමික වැදගත්කම පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බෞද්ධ ස්තූපවල පෙනෙන ආකෘතික ලක්ෂණ හඳුන්වා ශ්‍රී ලංකාවේ පැරණි ස්තූපවල මේ ලක්ෂණ කොතෙක් දුරට දක්නට ලැබේ දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) 'වැවයි දාගැබයි' යන සංකල්පය මූර්තිමත් කරමින් වැව් හා දාගැබ් තැනවීමෙහි යෙදුණු පැරණි ශ්‍රී ලාංඡේය රජුන් **දෙදෙනෙකුගේ** සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner

2556 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2011 (2012)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

(ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) සංසාර විමුක්තිය ලැබීම ආශ්‍රිතව බුදු දහමෙහි ඉගැන්වෙන 'ත්‍රිවිට යාන' හඳුන්වා, ඒවා පිළිබඳ ව මහායානිකයන් දරන මතය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහායාන බුදු දහමෙහි බෝධිසත්ත්ව වන්දනාවට විශේෂ ස්ථානයක් හිමි වී ඇති ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ධ්‍යානී බෝධිසත්ත්වවරුන් ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) ධර්මාශෝක අධිරාජයා ධර්මප්‍රචාරය සඳහා යොදාගත් උපාය මාර්ග පිළිබඳ විශ්ලේෂණයක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) එම අධිරාජයා ධර්මප්‍රචාරය සඳහා තෝරාගත් රටවල් **හයක්** හා ඒවාට යැවූ ධර්මදූතයන්ගේ නම් දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) එම අධිරාජයාගේ අනුග්‍රාහකත්වයෙන් පැවැත්වූ ධර්ම සංගීතියේ ප්‍රතිඵල කවරේදැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ වලඟි විශ්ව විද්‍යාලයේ ආරම්භය පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) එම විශ්ව විද්‍යාලයේ ඉගැන්වූ විෂය මාලාව හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) එම විශ්ව විද්‍යාලය ගැන විදේශීය සංචාරකයින්ගේ වාර්තාවල ඇතුළත් කරුණු ගැන සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ඓතිහාසික මූලාශ්‍ර අනුව ජෙනාගම ශ්‍රී ලංකාවේ පැතිර ගිය බවට දැක්විය හැකි සාධක කවරේදැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ප්‍රාග් බෞද්ධ යුගයේ දී ශ්‍රී ලංකාවේ පැතිර ගිය යක්ෂ ඇදහිලි ගැන විශ්ලේෂණයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහින්දාගමනය නිසා ශ්‍රී ලංකාවට ලැබුණු උත්කෘෂ්ට දායාද කවරේදැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) වෘක්ෂ වන්දනාව ද, දෙවියන් හා ප්‍රේතයන් පිළිබඳ විශ්වාස ද පැතිර ගිය ශ්‍රී ලාංකික සමාජය බුදු දහම කෙරෙහි යොමු කරවීම සඳහා මිහිඳු හිමියන් උපයෝගී කොටගත් ක්‍රමෝපාය ගැන විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) පංචශීල ප්‍රතිපත්තියට මුල් තැන දුන් දැහැමි සමාජයක් ගොඩ නැංවීම උදෙසා ඇතැම් පැරණි ශ්‍රී ලාංකේය රජදරුවන් අනුගමනය කළ ක්‍රියා මාර්ග කවරේදැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) දුටුගැමුණු කුමාරයාගේ රාජ්‍ය පදප්‍රාප්තිය මෙරට ස්වෛරීභාවය ආරක්ෂා කිරීමට මෙන් ම ශාසනයේ විරස්ථිතිය පදහා ද හේතු වූ ආකාරය විභාග කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) "ශ්‍රී ලංකා රාජ්‍ය පාලනය බෞද්ධ රජදරුවන්ට ම අයත් විය යුතුය" යන සංකල්පය මෙරට මුල් බැස ගැනීමට හේතු වූ කරුණු නිදසුන් මඟින් පිරික්සන්න. *(ලකුණු 06 යි)*

(ii) "ශ්‍රී ලාංකේය රජදරුවන් බොහෝ විට බුද්ධ ශාසනයේ දියුණුවට හා ආරක්ෂාවට ක්‍රියා කළ අතර ස්වකීය ආරක්ෂාවට ද ශාසනය උපයෝගී කර ගත් බව පෙනේ." මෙබදු නරපතියන්ගේ ක්‍රියාකාරිත්වය ඇසුරින් මේ ඳදහස ගැන සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

(iii) සතර අගතියෙන් තොරව දශරාජ ධර්මයෙහි හැසිරෙමින් සිවුපසඟරාවතින් යුතුව මහජනතාවට සංග්‍රහ කිරීමට ප්‍රයත්න දැරූ ශ්‍රී ලාංකේය රජුන් පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) ශ්‍රී ලංකාවේ නිර්මිත බුදුපිළිමවලින් නිරූපිත ඉරියවු හඳුන්වා දෙමින්, එයින් එක් පිළිම වර්ගයක් තෝරා ගෙන ඒවා පිහිටි ස්ථාන ගැන කොරතුරු සපයන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවේ බුදුපිළිමවල දක්නට ලැබෙන මුද්‍රා පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) තිවංක බුදුපිළිම කවරේ දයි හඳුන්වා, ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන මෙබඳු පිළිම ගැන විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2554 – බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2009 (2010)

S 4

පැ තුනයි

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

I කොටසේ **සියලු** ම ප්‍රශ්නවලට ද II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
සැ.යු. :- I කොටසේ ප්‍රශ්නවලට **පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම** ලියා II කොටසේ පිළිතුරු සමග **අමුණා ශාලාධිපතිට භාර දෙන්න.**

විභාග අංකය : .....

I කොටස

1. (i) (අ) ධර්මගුප්තික හා මහිංසාසක යන දෙනිකායිකයන් විසින් තම ආදි පුරුෂයා ලෙස සලකනු ලැබුයේ කවරෙක් ද?

.....

(ආ) මේ ආදි පුරුෂයා ප්‍රථම සංගීතිකාරකයින්ට ඉදිරිපත් කළ ප්‍රකාශය කුමක් ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) මහාදේව තෙරුන්ට බෞද්ධ ඉතිහාසයෙහි වැදගත් තැනක් හිමි වන්නේ ඇයි?

.....

.....

(ආ) හීන අධිගමයක් ලෙස අර්හත්වය හඳුන්වාලමින් පළ වූ මතය ඛණ්ඩනය කෙරෙන ථෙරවාදීන්ගේ අගනා ග්‍රන්ථය කුමක් ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) ද්විතීය ධර්ම සංගීතියට මුල් වූ දශ වස්තුව ඉදිරිපත් වූයේ ථෙරවාදීන්ගේ කවර සම්මතයකට විරෝධය පළ කිරීමක් වශයෙන් ද?

.....

.....

.....

(ආ) මේ දශ වස්තුව පිළිගත්තෝ කවරහු ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) වාත්සීපුත්‍ර හිමියන් ඉදිරිපත් කෙළේ යැයි සැලකෙන "අලුත් මතය" වූයේ කුමක් ද?

.....

.....

(ආ) මේ මතයට ශාකිවිරුද්ධව ථෙරවාදීන් පළ කළ අදහස කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

[2 වන පිටුව බලන්න.

Scanned by CamScanner

(v) (අ) ගෝතුලික නිකාය පැන නැගුණේ කවර ප්‍රධාන නිකායයක් ඇසුරෙන් ද?

.....

(ආ) මේ නිකායිකයන්ගේ මූලික මතය වූයේ කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(vi) (අ) දින්නාගපාද කාගේ ශිෂ්‍යවරයෙකු ලෙස සැලකේ ද?

.....

(ආ) මහායාන බුද්ධ ධර්මයේ දියුණුවට උන්වහන්සේගෙන් සැලසුණු සේවය කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(vii) (අ) බුරුමයේ (මියන්මාරයේ) කල්‍යාණී ශිලා ලිපි පිහිටුවන ලද රජතුමා කවුරෙක් ද?

.....

(ආ) මේ ශිලා ලිපි මගින් අනාවරණය වන්නේ කුමක් ද?

.....

.....

.....

(ලකුණු 03 යි)

(viii) (අ) භාරතයේ නාලන්දා විශ්ව විද්‍යාලයේ සිප්සතර හදාළ චීන ජාතික යතිවරයා කවරෙක් ද?

.....

(ආ) බුදුදහමේ ව්‍යාප්තිය උදෙසා උන්වහන්සේගෙන් සැලසුණු සේවය කුමක් ද?

.....

.....

.....

(ලකුණු 03 යි)

(ix) (අ) සුත්තනිපාතයට ලියැවුණු පාලි අටුවා ග්‍රන්ථයේ නම කුමක් ද?

.....

(ආ) හෙළටුවා නමින් හැඳින්වෙන ප්‍රධාන අටුවා ග්‍රන්ථ නම් කරන්න.

.....

.....

(ලකුණු 03 යි)

(x) (අ) හිඳි පිළිමවල යොදා ඇති ධ්‍යාන මුද්‍රාවෙන් පිළිබිඹු වන විශේෂ ලක්ෂණ මොනවා ද?

.....

.....

(ආ) ධ්‍යාන මුද්‍රා සහිත පිළිම හොඳට ඇති ශ්‍රී ලංකාවේ ස්ථාන දෙකක් නම් කරන්න.

.....

.....

(ලකුණු 03 යි)

PAST PAPERS WIKI

Scanned by CamScanner

2554 – බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2009 (2010)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

(ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න)

II කොටස

2. (i) මහායාන බුදුසමයේ ඇතුළත් බෝධිසත්ත්ව සංකල්පය කෙටියෙන් හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*
(ii) බෝධිසත්ත්ව අදහස් ශ්‍රී ලංකාවේ පැතිර පවත්නා ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(iii) සංසාර විමුක්තිය පිළිබඳ ව තෙරවාදීන් දරන මතය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) බුදුසමයේ ව්‍යාප්තිය උදෙසා කනිෂ්ක රජතුමාගෙන් සැලසුණු සේවය ගැන ඇගයීමක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) මේ රජතුමා විසින් ලියවන ලද විහාරා ග්‍රන්ථ යනු කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*
(iii) කනිෂ්ක රාජ්‍ය සමයෙහි විසූ පැවිදි පඬිවරුන් නමිකර ඔවුන්ගෙන් සැලසුණු සේවය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ පැවති බෞද්ධ විශ්ව විද්‍යාල නම් වශයෙන් දක්වා එයින් **එකක්** ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*
(ii) නාලන්දා විශ්ව විද්‍යාලයේ බෞද්ධ ධර්ම ශිෂ්‍යයා ධාරාවට අයත් වූ පාඨමාලා විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) නවක ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා නාලන්දා විශ්ව විද්‍යාලයෙහි පැවති ප්‍රවේශ පරීක්ෂණයේ ස්වරූපය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) විජයාවතරණයත් සමග ශ්‍රී ලංකාවේ දියුණු ආර්ය සංස්කෘතියක් ආරම්භ වූ බව තහවුරු කළ හැකි සාධක මොනවා දැයි පිරික්සන්න. *(ලකුණු 06 යි)*
(ii) පණ්ඩුකාභය රාජ්‍ය සමයේදී මෙරට පැවති නගරනිර්මාණ ශිල්පය පිළිබඳ ඇගයීමක් කරන්න. *(ලකුණු 06 යි)*
(iii) බුදුසමයේ සම්ප්‍රාප්තියත් සමග මෙරට ගෘහනිර්මාණ ශිල්පය නවමං මග්සේ දියුණු වූ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) බුදුසමයේ සුරක්ෂිත භාවය උදෙසා පැරණි ශ්‍රී ලාංකික රජදරුවන් දිවි හිමියෙන් ක්‍රියා කළ ආකාරය නිදසුන් මඟින් පනාථ කරන්න. *(ලකුණු 06 යි)*
(ii) ශ්‍රී ලංකාවේ පැතිර ගිය බුදුසමයෙහි විනයවාදීන්වයට විශේෂ ස්ථානයක් හිමි වූ බව හේතු සාධක මඟින් තහවුරු කරන්න. *(ලකුණු 06 යි)*
(iii) පාංශික ක්‍රමයට පටහැනිව පෞද්ගලික පරිත්‍යාග උදෙසා ඇතැම් ශ්‍රී ලාංකික රජුන්ගේ පෙළැඹීම නිසා සංඝ සමාජය තුළ අර්බුද ඇති වූ ආකාරය පිරික්සන්න. *(ලකුණු 06 යි)*

7. (i) මහාවංස රත්නයේ අනුමැතියෙන් තොරව රාජ්‍ය පාලනයට යාම මෙරට රජුන්ට දුෂ්කර කාර්යයක් වූ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(ii) බුදුසමයේ ආධ්‍යාත්මය නිසා මෙරට රජුන් සෞඛ්‍ය සේවය හා සමාජ සුභසාධනය කෙරෙහි යොමු වූ ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(iii) බුදුගුණ ප්‍රතිඵලයන් සමඟ [illegible] හා සම්බන්ධිතා ගුණයන් පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) බුදුදහමෙහි දැක්වෙන ත්‍රිවිධ වෛද්‍ය කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*
(ii) ප්‍රතිමාශර යනු කුමක් දැයි පැහැදිලි කොට මෙරට දක්නට ලැබෙන පැරණි ප්‍රතිමා ඝර තුනක් ගැන විස්තර සපයන්න. *(ලකුණු 06 යි)*
(iii) බුදුපිළිම නෙළීමේදී භාවිත කළ ආසන වර්ග ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner

හිමිකම් ඇවිරිණි]
பதிப்புரிமையுடையது]
Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

2553 – බෞද්ධ ධර්මාචාර්ය විභාගය (2008) 2009

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න)

II කොටස

1. (i) ධර්මශෝක රජ සමයට පෙර භාරතයේ පහළ වූ මහායාන බෞද්ධ නිකාය කුමක් ද? (ලකුණු 06 යි)
(ii) ශ්‍රී ලංකාවේ පැතිර ගිය මහායාන බෞද්ධ නිකාය කවරේ ද? (ලකුණු 06 යි)
(iii) ලෝකෝත්තරවාදී නිකායට අයත් මහාවස්තු නමැති ග්‍රන්ථයෙහි බුදුරජාණන් වහන්සේගේ ස්වභාවය පිළිබඳව දක්වෙන අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) කණිෂ්ක රජතුමාගෙන් සිදුවූ බෞද්ධ ශාසනික සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)
(ii) මේ රජතුමාගේ බුද්ධාගම වැළඳ ගැනීම සම්බන්ධයෙන් හියුං සියැං දේශාටකයා සිය වාර්තාවෙහි සටහන් කොට ඇති ප්‍රවාදාත්මක ප්‍රවෘත්තිය විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iii) ආත්ම විමුක්තිය සලසා ගැනීම ආශ්‍රිතව ථෙරවාද හා මහායාන සම්ප්‍රදාය අතර පවත්නා මතවාද විමසීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

4. (i) දර්ශනික අංශයට පමණක් සීමා නොවී පොදුජන චින්තනයට ද යෝග්‍ය ආකාරයෙන් ආගමික සම්ප්‍රදායක් බිහි කිරීමට මහායානිකයන් උත්සාහ ගත් ආකාරය පිරික්සන්න. (ලකුණු 06 යි)
(ii) මහායාන බෝධිසත්වවරුන් නම් වශයෙන් හඳුන්වා ශ්‍රී ලාංකිකයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ බෝධිසත්වවරුන් කවුරුන් දැයි දක්වන්න. (ලකුණු 06 යි)
(iii) මහායාන බුදුදහමට අනුව බුද්ධත්වය ලැබීමට පෙර බෝධිසත්වවරයෙකු පත්විය යුතු යේ සැලකෙන අවස්ථා හෙවත් භූමි දහය හඳුන්වන්න. (ලකුණු 06 යි)

5. (i) භාරතයේ පැවති බෞද්ධ විශ්ව විද්‍යාල කවරේ දැයි හඳුන්වන්න. (ලකුණු 06 යි)
(ii) බුදුසමයේ දියුණුව හා ව්‍යාප්තිය උදෙසා මේ විශ්ව විද්‍යාල මගින් සැලසුණු සේවය විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iii) දින්නාග ආචාර්යපාදයන්ගෙන් මහායාන බුදුසමයේ දියුණුවට සැලසුණු සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

6. (i) මේ රටේ රජතුමා බෞද්ධයෙකු විය යුතුය යනුවෙන් පැරණි ශ්‍රී ලාංකිකයන් අතර පැවති විශ්වාසය තහවුරු කළ හැකි සාධක කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(ii) රට පාලනය කිරීම උදෙසා පැරණි ලක් රජදරුවනට මහා සංඝයා වහන්සේගේ අනුමැතිය ලබා ගැනීම බෞද්ධයින් වැදගත් වූ ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(iii) පොදුජන සුභසාධන සේවා සැලසීම උදෙසා ශ්‍රී ලංකාවේ පැරණි රජදරුවන් අනුගමනය කළ ක්‍රියාමාර්ග විශ්ලේෂණය කරන්න. (ලකුණු 06 යි)

7. (i) පණ්ඩුකාභය රජතුමා ආගමික සහනශීලතාවයෙන් යුත් නරපතියෙකු ලෙස හැඳින්වීමට හේතුවන සාධක ඉතිහාසානුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(ii) ස්වකීය ජීවිතය ගැන පවා නොසලකා ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය සුරක්ෂිත කිරීමට අනුරාධපුර මහාවිහාරීය යතිවරයන් දරූ උත්සාහය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)
(iii) මහින්දාගමනය සිදු වූ සමයේ දී ලක්දිව පැවති භාෂාව හා එහි ආරම්භය ගැන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

8. (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණ සම්ප්‍රදාය කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ බුදුපිළිම නෙළීමේ ආරම්භය හා විකාශය විමසීමට ලක් කරන්න. (ලකුණු 06 යි)
(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බුදුරජාණන් වහන්සේගේ හිටිපිළිම පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)
(iii) බුදුපිළිම තැනීමේදී යොදා ගැනුණු මුද්‍රා හඳුන්වා මෙයින් ශ්‍රී ලංකාවේ භාවිත වූයේ කවර මුද්‍රා දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *

Scanned by CamScanner

(v) (අ) වාත්සීපුත්‍ර භික්ෂූන් ඉදිරිපත් කළ නව සංකල්පය කුමක් ද?

.....

(ආ) මේ මතය ප්‍රතික්ෂේප කරමින් ථෙරවාදීන් ඉදිරිපත් කළ කෘතියේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vi) (අ) ශාන්තිදේව ආචාර්යපාදයන් ලියූ ග්‍රන්ථය කුමක් ද?

.....

(ආ) මේ ග්‍රන්ථය ලිවීමේ අරමුණ කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(vii) (අ) කොරියාවට මුලින්ම බුදුසමය හඳුන්වා දුන්නේ කවරෙක් ද?

.....

(ආ) එවකට කොරියාවේ පිටි රාජ්‍ය පාලකයාගේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) පරමත්ථජෝතිකාවට පාදක වූ ත්‍රිපිටක ග්‍රන්ථය කුමක් ද?

.....

(ආ) විභංගයට ලියූ පාලි අටුවා ග්‍රන්ථය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(ix) (අ) ථායි ජාතික උපාලි මහතෙරණුවන්ට ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසයෙහි වැදගත් තැනක් ලැබීමට හේතු වූ කරුණ කුමක් ද?

.....

(ආ) මේ තෙරණුවන් වැවමවා ගැනීමට මුල් වූ ශ්‍රී ලාංකික රජතුමාගේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) පැතපෙන බුදුපිළිම තැනීම ශ්‍රී ලංකාවේ ආරම්භ වූ බව සැලකෙන්නේ කවර ශතවර්ෂයේ සිට ද?

.....

(ආ) මෙබඳු බුදුපිළිම දක්නට ලැබෙන ස්ථාන **දෙකක්** නම් කරන්න.

.....

(ලකුණු 03 යි)

(3 වන පිටුව බලන්න.)

Scanned by CamScanner

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2551 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2007 (2008)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ සියලු ප්‍රශ්නවලට ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා. II කොටසේ පිළිතුරු සමඟ අමුණා ශාලාධිපතිට භාරදෙන්න.

විභාග අංකය .....

I කොටස

1. (i) (අ) පුණ්ණ තෙරුන්ට ශාසන ඉතිහාසයේ වැදගත් තැනක් හිමිවී ඇත්තේ කවර හේතුවක් නිසා ද?

.....

.....

(ආ) ධර්ම විනය පවත්වා ගෙන යාම පිළිබඳ ව මේ හිමියන් පළ කළ මතය කුමක් ද?

.....

.....

(ලකුණු 02 යි)

(ii) (අ) ඒකබ්බෝහාරික නමැති නව නිකාය පැන නැගුණේ කවර ප්‍රධාන නිකායක් ඇසුරෙන් ද?

.....

.....

(ආ) අභිධර්මය පිළිබඳ විශේෂඥයන් අයත් වූයේ කවර නිකායකට ද?

.....

.....

(ලකුණු 02 යි)

(iii) (අ) ධර්මාශෝක මහරජතුමා වඩාත් පක්ෂපාතිත්වයක් දක්වා ඇත්තේ කවර නිකායකට ද?

.....

.....

(ආ) උපගුප්ත හිමියන් අයත් වූ නිකාය කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(iv) (අ) ලෝකෝත්තරවාදීන් වෙන් වී ගියේ කවර නිකායකින් ද?

.....

.....

(ආ) මෙසේ බිඳී ගිය නිකායේ අදහස් ඇතුළත් ග්‍රන්ථ මොනවා ද?

.....

.....

(ලකුණු 03 යි)

දෙවන පිටුව බලන්න.

PAST PAPERS WIKI

Scanned by CamScanner

(v) (අ) "මාසාතය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

.....

.....

(ආ) මෙය ප්‍රකාශයට පත් කළ භාරතීය හා ශ්‍රී ලාංකික රජවරු කවරහු ද?

.....

.....

(ලකුණු 03 යි)

(vi) (අ) ශූන්‍යතා සිද්ධාන්තය කවර නිකාය සම්ප්‍රදායකට අයත් වූවක් ද?

.....

.....

(ආ) මේ සිද්ධාන්තයෙන් හෙළි වන මූලික අදහස කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(vii) (අ) බුරුම ජාතික ඡප්පාව හිමියන්ට ශ්‍රී ලංකා ශාසන ඉතිහාසයෙහි වැදගත් තැනක් හිමි වන්නේ කවර හේතුවක් නිසා ද?

.....

.....

(ආ) මේ හිමියන් බුරුමයේ පිහිටි වූ නව නිකාය කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(viii) (අ) "නිවිරෙන්" නිකාය දස්නට ලැබෙන්නේ කවර රටේ ද?

.....

.....

(ආ) මේ නිකායිකයන් නියම බුදු සමය ලෙස සලකන්නේ කවර ධර්ම සූත්‍රයක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(ix) (අ) ධම්මසංගණියට ලියැවුණු පාලි අටුවා ග්‍රන්ථයේ නම කුමක් ද?

.....

.....

(ආ) සුමංගල විලාසිනියට පාදක වූ ත්‍රිපිටක ග්‍රන්ථය කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(x) (අ) ත්‍රිභංග හෙවත් තිවංග බුද්ධ ප්‍රතිමාවල විශේෂ ලක්ෂණය කවරේ ද?

.....

.....

(ආ) මෙබඳු පිළිමයක නිෂ්ටාවශේෂ දක්නට ලැබෙන්නේ කොතනක දී ද?

.....

.....

(ලකුණු 03 යි)

[ඉතිරිය පිටුව බලන්න.

Scanned by CamScanner

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) බුද්ධ සංකල්පය පිළිබඳ වූ මහායාංශික නිකාය ඉදිරිපත් කරන මහවාද කවරේ දැයි විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) රහතන් වහන්සේගේ තත්ත්වය අවතක්සේරු කිරීම සඳහා මහාදේව තෙරුන් පළ කළ අදහස් දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) පුද්ගල සංකල්පයෙහි විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) ධර්මාශෝක රජතුමා අනුගමනය කළ ධර්මවිජය ප්‍රතිපත්තිය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ගාරහයේ ආගමික සහනශීලිත්වය ඇති කිරීම උදෙසා ධර්මාශෝක රජතුමා යෙදූ උපාය මාර්ග විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ධර්මාශෝක රජතුමාගේ ධර්මයාත්‍රා සංකල්පය හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

4. (i) තෙරවාද සම්ප්‍රදාය අර්හත්ව නිවුක්තිය උදෙසාත්, මහායාන සම්ප්‍රදාය පරාර්ථ වීර්යාව උදෙසාත් යොමු වී ඇති ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) තෙරවාද බෞද්ධයන්ගේ කුසලතරා බෝධි සංකල්පය හඳුන්වා මහායානිකයන් මේ මගින් හඟවන්නේ ආකාරය දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) බුද්ධත්වය උදෙසා පාරමිතා පිරීම අත්‍යවශ්‍ය අංගයක් බව තෙරවාද හා මහායාන සම්ප්‍රදායයන්හි ඉගැන්වෙන ආකාරය අතරතුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය යන ආයතන ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ ආකාරය පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ධර්මධාතු නමැති ග්‍රන්ථය හඳුන්වා දීම නිසා ශ්‍රී ලාංකික භික්ෂූන් අතර පැනිර ගිය මත භේද නිරාකරණය වූයේ කෙසේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) වෛතුල්‍යවාදය ගැන කෙටි හැදින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) ආපදා අවස්ථාවන්හි දී භික්ෂූන් වහන්සේගේ පිහිට ලද ඇතැම් ශ්‍රී ලාංකික නරපතියන් පෙරළා රාජ්‍යත්වයට පැමිණ බුද්ධ ශාසනයේ දියුණුවට ක්‍රියා කළ අවස්ථා තුනක් නිදසුන් මගින් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකා බුද්ධ ශාසන ඉතිහාසයේ අද්විතීය ස්ථානයක් දුටුගැමුණු රජතුමාට හිමි වන්නේ ඇයි දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහා පරාක්‍රමබාහු රජතුමාගෙන් (1153 – 1186) ශ්‍රී ලංකාවට හා සම්බුද්ධ ශාසනයට සිදු වූ සේවය පිළිබඳ ඇගයීමක් කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) ප්‍රාග් බෞද්ධ යුගයේ දී ශ්‍රී ලංකාවේ ශෛව ඇදහිලි හා විශ්වාස පැවති බවට දැකිය හැකි සාධක කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ප්‍රාග් මහින්ද යුගයේ සිට ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මණයින්ට විශේෂ ස්ථානයක් හිමි වූ බව තඹවුරු කෙරෙන සාධක මොනවා දැයි විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිට ශ්‍රී ලංකාවේ යක්ෂයන් ඇදහීම දක්නට ලැබෙන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) බුද්ධ කාලයේ සිට ම ස්තූප නිර්මාණය පැවති බවට දැක්විය හැකි හේතු සාධක මොනවා දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ථූපඝර / චෛත්‍යඝර යනු කුමක් දැයි විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ස්තූපයක දක්නට ලැබෙන අංගෝපාංග කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

❋ ❋ ❋

Scanned by CamScanner

2550 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2006 (2007)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) ප්‍රථම ධර්ම සංගායනාව ගැන පුරාණ තෙරුන් පළ කළ අදහස් මොනවා ද? *(ලකුණු 06 යි)*

(ii) ධර්මගුප්තික හා මහිංසාසක යන දෙනිකායේ වාර්තාවල දැක්වෙන පරිදි පුරාණ තෙරුන්ගේ මැදිහත්වීම නිසා අනුමත කරවා ගත් ප්‍රථම සංගීති විනයෙන් බැහැර වූ කරුණු අට කවරේද? *(ලකුණු 06 යි)*

(iii) ප්‍රථම සංගීතියෙන් පසු පුරාණ තෙරුන් පළ කළ අදහස්වලින් එකල ශාසනික තත්ත්වය ගැන එළැඹිය හැකි නිගමන කෙටියෙන් දක්වන්න. *(ලකුණු 06 යි)*

3. (i) කණිෂ්ක රජතුමා බුදුසමය වැළඳ ගැනීමට තුඩු දුන් හේතු වශයෙන් හියුංසියැං වාර්තාවෙහි ඇතුළත් කරුණු කෙටියෙන් දක්වන්න. *(ලකුණු 06 යි)*

(ii) ධර්ම සංගායනාවක් පැවැත්වීමට කණිෂ්ක රජතුමාගේ අවධානය යොමු වූ හේතු සාධක පැහැදිලි කර දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) මේ සංගායනාව අවසානයේ දී ධර්මයේ විරස්ථායී භාවය උදෙසා කණිෂ්ක රජතුමා ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? *(ලකුණු 06 යි)*

4. (i) බෝධිසත්ත්ව සංකල්පය කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(ii) බෝධිසත්ත්වවරයකු තුළ තිබිය යුතු උත්තරීතර ගුණාංග මොනවා දැයි දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) මහායාන ග්‍රන්ථවල දැක්වෙන බෝසත්වරු අට දෙනා කවුදැයි නම් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ශ්‍රී ලංකාවේ අනුරපුර යුගයේ දී බුදුසමය හා රජය අතර පැවති දැඩි සම්බන්ධතාව හෙළි කරන අවස්ථා තුනක් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහා විහාරයට විරුද්ධ ව ක්‍රියා කළ ශ්‍රී ලාංකේය රජුන් හා එසේ ක්‍රියා කිරීමට ඊට තුඩු දුන් හේතු කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) අනුරපුර යුගයේ ශ්‍රී ලාංකික භික්ෂූන් රාජ්‍ය පාලකයන්ට පවා විරුද්ධව නැගී සිටි අවස්ථා ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) පැරණි භාරතීය විශ්ව විද්‍යාලවලින් එකක ඉගැන් වූ ආගමික විෂය ධාරා කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(ii) නාලන්දා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට පැමිණි සිසුන් වර්ග තුනක් යටතේ බඳවා ගත් ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) වික්‍රමශිලා විශ්ව විද්‍යාලය ගොඩ නැංවුණු ආකාරය ගැන කෙටි විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) ගන්ධාර හා මථුරා සම්ප්‍රදාය කෙරෙහි අවධානය යොමු කරමින් බුදු පිළිම නිර්මාණයේ ඉතිහාසය කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අනුරාධපුර යුගයට අයත් ප්‍රසිද්ධ බුද්ධ ප්‍රතිමා කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සමාධි, ධර්ම චක්‍ර හා භූමි සපර්ශ මුද්‍රා පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) දඹදිව සාංචි ස්තූපයේ ආකෘතික ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) බුබ්බුලාකාර, සටාකාර හා පද්මාකාර චෛත්‍ය හඳුන්වා ශ්‍රී ලංකාවේ මේ ආකෘති අනුව තැනූ චෛත්‍ය සඳහා නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) වටදාගෙය යනු කුමක් දැයි හඳුන්වා දෙමින් භාරතයට වඩා ලංකාවේ වටදාගේ වෙනස් වූ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner

17120

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

2549 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2005 (2006)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ සියලු ප්‍රශ්නවලට ද, II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද, ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැයු- I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා. II කොටසේ පිළිතුරු සමග අමුණා ශාලාධිපතිට භාර දෙන්න.

විභාග අංකය: .....

I කොටස

1. (i) (අ) ඒකබ්බෝහාරික නිකායයෙන් බිඳී ගියු අලුත් නිකාය කුමක් ද?

ලෝකෝත්තර වාදීහු

(ආ) මේ නිකායිකයන්ගේ ඉගැන්වීම් ඇතුළත් ග්‍රන්ථ මොනවා ද?

මහාවස්තුව , ලලිතවිස්තර

(ලකුණු 03 යි)

(ii) (අ) වාත්සිපුත්‍ර හිමියන් ඉදිරිපත් කළ නව සංකල්පය නම් කරන්න.

පුද්ගල අනාත්මයක් - ඊ මාර්ග ඵලයෙන් පුද්ගලයෙහි ඒක අනාත්ම ලක්ෂණ ප්‍රතිලාභී කිරීම

(ආ) මේ සංකල්පය ප්‍රතික්ෂේප කරමින් ස්ථවිරවාදීන් ලියූ කෘතිය කුමක් ද?

කථාවත්ථු ප්‍රකරණය

(ලකුණු 02 යි)

(iii) (අ) කණිෂ්ක රජතුමාගේ සංගායනාවේ මූලිකත්වය දැරූ බෞද්ධ භික්ෂුහු කවරහු ද?

පාර්ශ්ව , වසුමිත්‍ර

(ආ) මේ සංගායනාවේ දී සම්පාදිත මූලික බෞද්ධ ග්‍රන්ථ මොනවා ද?

විභාෂා ග්‍රන්ථ , අභිධර්ම විභාෂා

(ලකුණු 02 යි)

(iv) (අ) බෞද්ධ තර්ක ශාස්ත්‍රයෙහි අසහාය විශේෂඥයා වූ මහායාන ආචාර්යවරයා කවුරුන් ද?

දිඞ්නාග සහ ධර්මකීර්ති

(ආ) මේ ආචාර්යවරයා ලියූ කෘති නම් කරන්න.

ආලම්බන පරීක්ෂා , හේතු චක්‍රහෘදය , ප්‍රමාණ සමුච්චය

(ලකුණු 03 යි)

(දෙවෙනි පිටුව බලන්න

Scanned by CamScanner

Past Papers Wiki

(v) (අ) මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී බුරුමයේ සිට ශ්‍රී ලංකාවට පැමිණි භික්ෂූහු කවරහු ද?

.....

.....

(ආ) මේ භික්ෂූන් පෙරළා බුරුමයට වැඩමවීමෙන් පසු එහි බුදුසසුන ආශ්‍රයෙන් ඇති වූ වැදගත් සිදුවීම් කවරේ ද?

.....

.....

(ලකුණු 03 යි)

(vi) (අ) චීනයේ මාධ්‍යමික බෞද්ධ සම්ප්‍රදායයේ ආරම්භකයා නම් කරන්න.

Bhayo සියාං

.....

(ආ) ඔහු චීනයේ චීන බසට පරිවර්තිත කෘති මොනවා ද?

.....

.....

.....

(ලකුණු 03 යි)

(vii) (අ) අනුරපුර යුගයේ විසූ මහසෙන් රජුට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ ඇමතිවරයා කවුද?

.....රම්මණ්ණාරාමය.....

(ආ) මේ ඇමතිවරයා රජුට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීමට තුඩුදුන් හේතුව කුමක් ද?

.....බෞද්ධාගමික වශයෙන් විශේෂ වැදගත්කමක් ඇති .....

.....විහාර, විහාර භූමි විශාල වශයෙන් විනාශ කිරීම .....

.....මගින් බෞද්ධ ජනතාව අතර ඇති වූ .....

(ලකුණු 03 යි)

(viii) (අ) තිවංක බුදු පිළිමයක් සොයා ගෙන ඇත්තේ ලංකාවේ කිනම් ස්ථානයකදී ද?

.....තොරණින්නාරුවේ.....

.....

(ආ) මේ ප්‍රතිමා වර්ගයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කවරේ ද?

.....ගෙල, වුව හා දණහිස යන තැන් තුනේ නැමීම.....

.....තිබීම.....

(ලකුණු 03 යි)

(ix) (අ) වාහල්කඩ සම්බන්ධ කර ඇත්තේ කවර බෞද්ධ නිර්මාණයකට ද?

.....බෝධාරාමය.....

(ආ) මෙසේ වාහල්කඩ තැනීමේ අරමුණ කුමක් ද?

.....බෝධාරාම භූමියේ සිදුහැ වැටීම, ...

.....

.....

(ලකුණු 03 යි)

(x) (අ) මනෝරථපූරණිය ලියන ලද්දේ කවුරුන් විසින් ද?

.....බුද්ධඝෝෂ.....

(ආ) මේ කෘතියට පාදක වූ ග්‍රන්ථය කුමක් ද?.

.....විසුද්ධිමග්ග.....

(ලකුණු 03 යි)

(මුළු ලකුණු 28 යි)

(තුන්වෙනි පිටුව බලන්න

Scanned by CamScanner

PARCEL NO

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන්|පසුගිය ප්‍රශ්න පත්‍ර|වැඩ පොත් සඟරා|O/L ප්‍රශ්න පත්‍ර|
A/L ප්‍රශ්න පත්‍ර|අනුමාන ප්‍රශ්න පත්‍ර|අතිරේක කියවීම් පොත්|
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prabashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න

www.Pastpapers.Wiki

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library